●නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මකව විඳ ගැනීම සහ මානව හිතවාදියෙක් ලෙස සමාජ ගත වීමේ හැකියාව ප්‍රදර්ශණය කරයි

**5.1.1කාළගෝල නාට්‍යය රසවිඳිමු.**



☛ දික්තල කාළගෝල නාට්‍යයේ නාට්‍ය ධර්මී ශෛලිය ඉස්මතු වන අවස්ථා

සාමාන්‍ය ලෝකයේ සිදුවන සාමාන්‍ය සිද්ධියක් දකිනවාට වඩා නාට්‍ය ධර්මී නාට්‍යයක ඊට ම ආවේණික ශෛලාගත ආකාරයට ඉදිරිපත් කිරීම් සිදුවෙයි.වේදිකාව මත සිදුවන්නේ සත්‍ය සිදුවීමක් නොවූවද ප්‍රේක්ෂකයා තම ඇස් ඉදිරියේ සිදුවන්නේ සිදුවීමක් බවට විශ්වාසයෙන් නරඹයි.ගමන් බිමන් තාලයකට අනුව සිදුවෙයි.සංවාද ගීතාත්මකය.ඒ අනුව දික්තල කාළගෝල නාටයයේ කාළගෝල යුවල දුර කතරක් ගෙවාගෙන පැමිනෙන බව පෙන්වන ගමන් විලාසයත් දික්පිටියා මාලු බාවබව පෙන්වන අභිනයත් දික්පිටියා දික්තල සමඟ ගඟෙන් එගොඩ වීමත් ගායනා විලාසයෙන් ඉදිරිපත් කිරීම නාට්‍යධර්මී ලක්ෂණ ලෙස හඳුන්වා දිය හැක.

මෙම කරුණු වඩාත් හොඳින් අවබෝධ කරගැනීම සඳහා පහත සබැඳිය ඔස්සේ මුලු කාළගෝල නාට්‍යයම ඔබට නැරඹිය හැකිය.

https://youtu.be/LPRGYExdwZI


☛ සතර අභිනය ඉතා විශිෂ්ට ලෙස යොදාගෙන ඇති අවස්ථාවන්

ආහාර්ය අභිනය

මෙම නාට්‍යයේදී  ආහාර්ය අභිනය ඉතා ප්‍රබල ලෙස භාවිතා කරඇති අයුරු පැහැදිලිය.රංග වස්ත්‍ර නිර්මාණකරනයෙදි කාළගෝලගේ මිටි බව පෙන්වීමට දණහිසටත් වඩා කොට රෙදිකඩක් ද මහත කෙටි උඩකය ඇදුමක්ද ඇඳ සිටීමත් උර මත රෙදි කඩක් තිබිමත් සොඳින් සැලසුම් කරන ලද්දකි.උස පෙන්වීමට දික්තල හා දික්පිටියා පාදාන්තය දක්වා දික් වූ ඇදුම් ඇද ඇත.පණ්ඩිතුමාගේ ඇදමද යම් රාජකීයත්වයක් ඉස්මතු වන අන්දමට නිර්මානය කොට ඇත.

අංගරචනයේදී කාළ වර්ණයෙන් කාළගෝල හැඩගන්වා තිබීම හා දික්තලාගේ සුරූපී බව මවන අන්දමට ද මතුකොට දක්වා ඇත.






<u>වාචික අභිනය</u>

ගීත ගායනා හා සංගීතය ප්‍රබලව යොදාගෙන ඇති අතර මධුර තනු යොදාගත් ගීතයන් නාටකය තුළ ඇත.සංගීතයට විශේෂ දක්ෂතාවයක් පෙන්වූ පුණ්‍යසේනයන් තමාගේ පියාණන්ගේද සහය ඇතිව ගීත නිබන්ධනය කල බව කියැවෙයි.සාම්ප්‍රදායික ගී තනු මෙන් ම නව නාට්‍ය ගීත මගින්ද නාටකය ගීතවත් ව ඇත.ඉතා කෙටි සරල සංවාදයන් වලින් යුක්තය.

"මොකදෑ ඔහෙලා හිනැහෙන්නේ නෑ අම්මපා කියනවකෝ ඕයි"

ගීතවත් ඇතැම් සංවාද හාස්‍ය රසයෙන් යුක්තය.



ගායනය - මැණිකෙ අත්තනායක


ඇන්නැවේ මේ මිල කෝලං
පාරේ යන්නට බෑ මූන්දු සමිණින්//
ඇන්නැවේ මේ මිල කෝලං
පාරේ යන්නට බෑ මූන්දු සමිණින්//

මව්පියො නිදහස් වෙන්ට සිතා සැද
දුන්නේය මා මේ අඟුටුමිට්ටියාට//
මව්පියො නිදහස් වෙන්ට සිතා සැද
දුන්නේය මා මේ අඟුටුමිට්ටියාට//

අඟුටුමිට්ටියා වට මං සුන්දරියේ
නැද්ද නැඩිරුව මං ඇයි සුන්දරියේ
නැද්ද නැඩිරුව මං//
කාලා බීලා සැපසේ ඉඳ කල් ඇර//
වව්වා කෙව්වා නිච්චේ කාලුරුද කුඩියා//

ඇන්නැවේ..//

සැපසේ හිඳ කල් ඇර සිතුවැතු සමිඳුන්ම ලැබෙයිද මට..
ලැබෙයිද නොලැබෙයිද කියා හිතාම බලන්න බැරියැයි ඉතින්...
ඔච්චර ඉතින් .. හිතාම බලන්න බැරියැයි..



නාට්‍යය - දික්තල කාලගෝල (පුණ්‍යසේන ගුණසිංහ)
ගායනය - උදේනි චන්ද්‍රසිරි

ඒයි හිච්චල්ලා හිච්චල්ලා හොගෝනින්//
මට බැරිය ඉතින් සිලා ඉන්න
ගහට පනිමි අම්මෝ
මම ගහට පනිමි අම්මෝ..
ඒයි හිච්චල්ලා..//
ගහට බැහැලුවොත් කිඹුලා කාවි//
කිඹුල කනත් මං මැරෙනත්
ගහට පනිමි අම්මෝ
මම ගහට පනිමි අම්මෝ..
ඒයි හිච්චල්ලා..//
මිගෙ යන යන මෙමගෙ පලයන් අම්මෝ
දුක්ඛය ///
ගහ හැඹිලුය මොකද දොඩමින
මිය මිනෙ තෙර ලඳ මිගෙ සොරකම් කරගෙන
යන්නෙ කීමිද දැන්
කරගෙන යන්නෙ කීමිද දැන්
වියරුද//
අඟුටුමිට්ටිය මෙලද මිගෙය
කඩම් ඉලය දැන් මෙතනම//
මිගෙ යන යන මෙමගෙ පලයන් අම්මෝ

<u>ආංගික අභිනය</u>

රංගඋපකරණ භාවිතයෙන් තොර නාට්‍ය වල ආංගික අභිනය ඉතා ප්‍රබල ලෙස භාවිතා කරනු ලබයි.කැවුම් කඳක් කර තබාගෙන පැමිණෙන කාළගෝලයා එය බිමින් තබා ගිමන් හරියි.දික්පිටියා ගඟට බැස පිහිනයි.දික්තලා කැටුව එතෙර වෙයි මෙවැනි ප්‍රබල ආංගික අභිනයන් මෙම නාට්‍ය පුරාවට ම වෙයි.

## ☛ නාට්‍යයේ ගැටුම් අවස්ථාවන්

කාළගෝල හා දික්තලා කෙරෙහි දක්වන හැඟීම් සංවාද වලින් පමණක් නොව ගීත වලින්ද මනාව මතුවෙයි.මෙය මානසික ගැටුමකි.කාළගෝල "පුරහඳ පායා දිළෙන වැනි මූණ තිගේ"යැයි පවසන විට දික්තල පවසන්නේ "නින්දා කරයි දුටුවන්"යනුවෙන්ය.දිත්පිටියා හමුවීමෙන් අනතුරුව කාළගෝල හා දික්පිටියා අතර භෞතික ගැටුමක් ඇති වෙයි.නඩු විභාගය අතර ඇති වන මත ගැටුම කොයි අවස්ථාවේ වාසිය කා අතට විසි වෙයිද යන දෙගිඩියාවත් කාළගෝල ජය ගැනීමෙන් ලබන සතුටටත් නැවත පඬිවරයාගේ කැඳවීමෙන් මතුවන ප්‍රශ්නයත් කාළගෝලයාට ෂත්‍ය අවබෝධ වීම නිසා ගැටුම වෙනතකට යොමුව නොසිතූ ලෙෂ දික්තල දික්පිටියාට ම හිමි වීමත් ගැටුම් අවස්ථා වෙයි.

දික්තල කාළගෝල ආරම්භය ම ගැටුමකි.දෙදෙනා පැමිණෙන්නේ යහපත් සබඳතාවක් ඇතිව නොවේ.කාළගේල දික්තලාට ඇලුම් කරන නමුත් දික්තලා කාළගෝල පිළිතුල් කරයි.මෙට එක්තරා අන්දමක අභ්‍යන්තර ගැටුමකි.දෙදෙනාට ම ඊළඟට හමුවන බාධකය ගඟයි.ගඟ තරණයට කාළගෝලට ඇති බාධකය  උසින් අඩු වීමයි.ගඟ එක්තරා ආකාරයක සංතේකයකි.දික්තතල හා කාළගෝලගේ නොගැලපීම මෙයින් සංකේතවත් කරයි.එයට විසඳුම දික්පිටියා හමු වීම මෙතනදී සිදු වූවද එයද තවත් ගැටුමකට මුලාරම්භයකි.යුවල ඔහුගෙන් සරණ පතන නමුත් ගඟ ගැඹුරු බව පෙන්වමින් ඔවුන් දෙදෙනාව තව තවත් ව්‍යාකුල කරවයි.අවසානයේ ඇයව සහෝදරායකැයා සිතා ගඟන් එතෙර තරන්නට යැයි පැවසීමෙන් එවෙලේ කාළගෝලගේ සිතෙහි ඇති තත්වය වැටහෙයි.ගඟ ගැඹුරු නැති බව දැනගත් වහා ම දික්පිටියා හා කාළගෝල අතර භෞතික ගැටුම ආරම්බ වෙයි.මෙම ගැටුම කණ වැකෙන චත්තුදත්ත ඔවුන්ව පඬිතුමා හමුවට කැඳවාගෙන යන  අතර එක් ස්ත්‍රියකට පුරුෂයන් දෙදෙනෙකු අයිතිවාසිකම් කීමේ ගැටලුවට ඉන් පසුව ඔවුන් මුහුණපානු ලබයි.

පඬිතුමා මෙම ගැටලුව විසඳන ආකාරයද ඉතා රසවත්ය.ගැටලුව විසදීමෙන් අනතුරුව කාළගෝලට ඇත්තේ වසර හතක් බැල මෙහෙවර කොට ලබා ගත් ස්ත්‍රිය ඇයට ආලය නොකිරීමයි.ඔහු දික්තලාට ාපරලා තමාට ආලය කරන්නැයි අණ කරන්නටයැයි ඉල්ලා සිටියි.සැබෑ ම මානුෂීය ගැටලුව පැණනැගෙන්නේ මෙහිදීය.ආදරය යනු බලෙන් හෝ අණ කොට ලබා ගත හැක්කක් නොවන බව පඬිතුමා ඔහුට පැහැදිලි කොට දෙයි.

## ☛ නාට්‍යයේ චරිත හා චරිත ස්වාභාවයන්

මුලු කාළගේල නාටයයේ ම දැකිය හැක්කේ චරිත හයකි.එයින් ද ප්‍රධාන වන්නේ චරිත හතරකි.දික්තල  කාළගෝල දික්පිටියා හා මහෞෂධ පඬිවරයාය.සෙසු චරිත මහෞෂධ පඬිවරයා ගේ ගෝලයින් දෙදෙනෙකි.කාළගෝල කලු  මිටි වීර්යවන්ත චරිතයකි.ඔහුට ඔහු ගැන යම් ආඩම්බරයක් ඇත.ඔහු අසීරු අරමුණක් ජයගත් අයෙකි(දික්තලා ලබා ගැනීම).ඔහු නාටකයේ ප්‍රධාන චරිතයයි.ඔහු අවසානයේ හිමි නැති ප්‍රේමයක් වෙනුවෙන් පෙනී හිඳීමේ ඇති නිසරු බව වටහා ගැනීමට තරම් බුද්ධියකින් යුතු පුද්ගලයෙකි.

දික්තලා සාමාන්‍ය උස රෑමත් තරැණියකි.ඇගේ පෙනුම හා සැසඳීමේදී කාළගෝල සමඟ මඟට බැස යාම නින්දාවට කරුණකැයි ඇය සිතයි.කණගාටුවෙන් පසුවන ඇයට දික්පිටියා දුටු විට ඔහු පිළිබඳව සිතක් පහළ වන්නේ ඇය කාළගෝල සමඟ ඇති බැඳීම තුළ සතුටක් නොලබන නිසා යැයි සිතිය හැකිය.නමුත් කාළගෝල හැර දමා යෑම පිළිබඳවත් ඇයගේ සිතේ දුකක් ඇති බව ඇතැම් තැන් වලදී හෙළිවෙයි.

දික්පිටියා අවිවාහක කඩවසම් යම් වත්කමක් ඇති තරුණයෙකි.ඔහු ගයන කවි ඔහු ගෙවන ජීවිතයේ කාන්සිය ගැන ඉඟි සපයයි.දික්තලා දුටු සැණින් ඇය පිළිබඳ ආල සිතක් පහළ වුණි යැයි ඔහු ජනකවියෙන් ම පවසයි.දික්තලා පළමුව එගොඩ කරන්නට හේතුව ද එයමයැයි ප්‍රේක්ෂකයාට වැටහෙයි.

මහෞෂධ උත්තම චරිතයකි.ජාතක කතාවේ එන පරිදි ජන බලයක් ඇති විශ්මිත නුවණක් ඇති නායකයෙකි.ඇති ගැටලු විසදා දෙනවාට අමතරව ඔවුන්ගේ ජීවිත නව මංපෙතකට යොමු කිරීමට පවා මොහු සමත්ය.